# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2176/23 - 2020 මැයි මස 22 වැනි සිකුරාදා - 2020.05.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 (1) වැනි ව්‍යවස්ථාවට හා 46(1)(අ) වැනි ව්‍යවස්ථාවට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2019 දෙසැම්බර් මස 10 වැනි දිනැති අංක : 2153/12 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලදුව, වරින් වර සංශෝධනය කරන ලද නිවේදනය, 2020 මැයි මස 21 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් ලෙස තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගෝඨාභය රාජපක්ෂ,
ජනාධිපති.

2020 මැයි මස 21 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

උපලේඛනය

(1) එම නිවේදනයෙහි අංක (14) "රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි 13 වන අයිතමය ඉවත් කිරීමෙන්;

(2) එම නිවේදනයෙහි අංක (1) "ආරක්ෂක අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි 35 අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන්;

36. අඩු ආදායම්ලාභී, අඩු අධ්‍යාපන සුදුසුකම් සහිත ජනතාව ගේ නිපුණතාවයන් ඉහළ නංවමින්, වෘත්තීයවේදීන් මගින් කළමනාකරණය කරන මානව සම්පත් සංචිතයක් හරහා ඔවුන් රටේ සංවර්ධනයෙහි බහුවිධ කාර්යයන් සඳහා යොදා ගැනීම



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

37. රසායනික අවි වැඩි දියුණු කිරීම, නිපදවීම, රැස් කිරීම සහ භාවිතා කිරීම තහනම් කිරීම සහ ඒවා විනාශ කිරීම පිළිබඳව සම්මුතිය ක්‍රියාත්මක කිරීමට අදාළ කටයුතු,

38. සන්නද්ධ සේවාවල සාමාජිකයන්ට නිවාස ඉදිකිරීම පිණිස මූල්‍යමය සහාය ලබා දීම, ආධාර ලබා දීම, සන්නද්ධ සේවා සාමාජිකයින් විසින් මූල්‍ය ආයතන වලින් ණය ලබා ගැනීම සඳහා සහ එම ණය ගෙවීම සඳහා ආධාර ලබා දීම,

39. පොලිස් නිලධාරීන් ගේ සහ වෙනත් නීතිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන් ගේ වෘත්තීමය දැනුම හා නිපුණතා ඔවුන්ට අදාළ වෘත්තීයන්ට උචිත පරිදි වැඩි දියුණු කිරීම,

40. ත්‍රිවිධ හමුදා සහ සිවිල් නිලධාරීන් සඳහා ක්‍රමෝපායන් සහ ක්‍රමවේදයන් පිළිබඳ අධ්‍යාපනයක් ලබා දීම

(ආ) එහි I වැනි තීරුවෙහි අයිතම 35 සිට නැවත අංකගත කිරීමෙන් ;
(ඇ) එහි II වැනි තීරුවෙහි 31 අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන්;

32. බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුව
33. මිලෝදා ආයතනය (Academy of Financial Studies)
34. රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය
35. අපි වෙනුවෙන් අපි අරමුදල
36. ජාතික පොලිස් අභ්‍යාස ආයතනය
37. ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක විද්‍යායතනය

(ඈ) එහි III වැනි තීරුවේ " ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත (2005 අංක 13) අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන්;

- රසායනික අවි සම්මුතිය පිළිබඳ පනත (2007 අංක 58)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.